(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

**අංක. 121.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2011 සැප්තැම්බර් මස 08 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0596/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයේ මුළු තත්‍ය වියදම (ශුද්ධ ආර්ථික බදු වලය) කොපමණද;

(ii) ඍජු හා වක්‍ර බදු මගින් රජය උපයාගත් ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රජයේ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් කොපමණද;

(iv) රටේ දළ දේශීය නිෂ්පාදිතය කොපමණද;

(v) රජයේ අයවැය හිඟය කොපමණද;

යන්න පසුගිය වර්ෂ දහයට අදාළව, වාර්ෂික පදනමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එය පියවාගන්නේ කෙසේද සහ අයවැය හිඟය පියවාගැනීම සඳහා ලබාගත් ණය සඳහා වන පොලී පිරිවැය ලබා දෙන්නේ කෙසේද;

(ii) මෙම ජීවනරටාව තවදුරටත් ඉදිරියට ගෙන යාමට හැකිවන්නේද සහ රට ණය උගුලක් කරා ගමන් කරමින් සිටින්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1050/'10

2.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) ස්වේච්ඡා ගුරුවරුන්, ගුරු සහායකවරුන් ලෙස පත්කිරීමට අදාළ 2006.10.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/2/20/4/1/47 උප දරන 2007.02.10 දිනැති ලිපිය මගින් නිකුත් කරන ලද උපදෙස් අනුව, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් කළ අයදුම්පත් කැඳවීම පරිදි මහනුවර දිස්ත්‍රික්කයේ කටුගස්තොට, ගම්පොල, තෙල්දෙනිය, වත්තේගම, දෙනුවර සහ මහනුවර යන අධ්‍යාපන කලාපවලින් ඉදිරිපත් වූ අපේක්ෂකයින් අතරින් 61 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයේදී එම තනතුර සඳහා සුදුසුකම් ලද බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/2/29/4/1/47 List හා 2008.09.08 දිනැති ලිපිය මගින් ඔවුන්ට ගුරු සහායක පත්වීම් පිරිනමන ලෙසට මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම් වෙත නියෝග කර ඇති බවත්;

(ii) මෙතෙක් එම පත්වීම් ලබාදීම වෙනුවට 2010.02.10 දින ගුරු පුහුණුව සඳහා නියමිත මධ්‍යස්ථාන සඳහා අනුයුක්ත කරමින් අධ්‍යාපන ලේකම් විසින් අංක ED/1/20/6/24 යටතේ ලිපි යැවීම පමණක් සිදුකර ඇති බවත්;

(iii) එම තත්ත්වය නිසා ගුරු සහායක පත්වීම් ලැබීමට නියමිත ඉහත පිරිස තවදුරටත් අසරණභාවයට පත්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඔවුන්ට ගුරු සහායක පත්වීම් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1119/'11

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දකුණු පළාතේ රජයේ පාසල්වල ක්‍රියාත්මකවන පාසල් දන්ත චිකිත්සාගාරවල භෞතික හා මානව සම්පත්වල දැඩි හිඟයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ළමා දන්ත සෞඛ්‍ය රැක ගැනීම සඳහා ඉහත සඳහන් පාසල් දන්ත චිකිත්සාගාරවලට අවශ්‍ය භෞතික හා මානව සම්පත් කඩිනමින් ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

(iii) ඊට අදාළව ප්‍රතිපාදන වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1182/'11

4.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට වරාය වෙත මේ වනවිට පැමිණ ඇති ජාත්‍යන්තර නැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නැව් එම වරායට පැමිණි දිනයන් සහ පැමිණි රටවල් කවරේද;

(iii) එම එක් එක් නැවෙන් ගෙන්වන ලද භාණ්ඩවල නම් සහ භාණ්ඩ තොගයන්හි බර (ටොන්වලින්) වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හම්බන්තොට වරාය හරහා මෙරටින් අපනයනය කරන ලද භාණ්ඩ කවරේද;

(ii) මේ වන විට එම වරායෙන් භාණ්ඩ රැගෙන පිටත්ව ඇති නැව් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1259/'11

5.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මඟින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0598/'10

6.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීම,— (2)

(අ) (i) ඉදිරි වර්ෂ 8 සඳහා ප්‍රක්ෂේපිත දළ දේශීය නිෂ්පාදිතය (GDP) කොපමණද;

(ii) මේ දක්වා වූ පසුගිය වර්ෂ අටක කාලය තුළ ඒක පුද්ගල ආදායම වාර්ෂික පදනමින් කොපමණද;

(iii) මේ දක්වා වූ පසුගිය වර්ෂ අටක කාලය තුළ ඒක පුද්ගල ණය ප්‍රමාණය වාර්ෂික පදනමින් කොපමණද;

(iv) 1994/01/01, 2005/01/01 සහ 2010/08/01 යන දිනවලට ඒක පුද්ගල ඉපැයීම හා ණයවල අගයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1120/'11

7.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ධර්මාචාර්ය විභාගය සමත්ව මේ වනවිට දහම් පාසල්වල ඉගැන්වීමේ කටයුතුවල නිරතව සිටින ගුරු පිරිසට රජයේ ගුරු පත්වීම් ලබා දීමට අදාළව කැබිනට් පත්‍රිකා දෙකක් අනුමත කරගෙන තිබේද;

(ii) එම ගුරු පිරිසට 2600 වැනි සම්බුද්ධත්ව ජයන්ති වර්ෂය තුළදී රජයේ ගුරු පත්වීම් ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1183/'11

8.

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් මොනරාගල වත්තේ රබර් කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු මේ වනවිට නතර කර තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) එම වතුයායෙන් ලබාගන්නා රබර් කිරි ලබා දෙන ආයතනය කවරේද;

(iv) එම ආයතනය විසින් ලබා ගන්නා එක් ඒකකයක් (කිලෝ හෝ ලීටර්) සඳහා ගෙවනු ලබන මුදල කොපමණද;

(v) රබර් කිරි ඒකකයක වර්තමාන වෙළඳපොල මිල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් කර්මාන්ත ශාලාව සහ එයට අයත් වතුයාය විකිණීමට හෝ බදු දීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1260/'11

9.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1615/'11

10.

ගරු මොහොමඩ් අස්ලම් මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉහළගම, කටුකැලියාවේ පදිංචි ඩබ්ලිව්. අන්වර් මහතා සීප්පුකුලම සත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයේ 2000.08.15 දින සිට 2001.04.30 දින දක්වා අනියම් කම්කරුවෙකු ලෙස සේවය කර ඇති බවත්;

(ii) දින 255ක් අඛණ්ඩව, සතුටුදායකව සිය සේවාව ඉටු කරමින් සිටි ඔහුගේ සේවය ස්ථිර කිරීමට වගකිව යුතු නිලධාරීන් අපොහොසත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අනියම් කම්කරුවකු ලෙස දින 180ක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම සැලකිල්ලට ගෙන, අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව අන්වර් මහතා නැවත සේවයේ පිහිටුවා, ඔහුගේ සේවය ස්ථිර කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1121/’11

11.

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඕමන්ත ග්‍රාම නිලධාරී වසමත්, වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 787 D තොටහ ග්‍රාම නිලධාරී වසමත් සම්බන්ධ කරමින් බෙන්තර ගඟ හරහා ඕමන්ත තොටුපල ඉදිකිරීම සඳහා 1999 වර්ෂයේ දී මුල්ගල් තබා මේ වනවිට වර්ෂ එකොළහකට වැඩි කාලයක් ගත වී ඇති බවත්;

(ii) මෙතෙක් එහි ඉදිකිරීම් සිදු කර නොමැති බවත්;

(iii) එම නිසා ප්‍රදේශයේ විශාල ජනතාවකට ලැබිය යුතු ප්‍රතිලාභ අහිමි වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, වෙන්කර ඇති මුළු මුදල කොපමණද;

(iv) පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1184/’11

12.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ස්ථිර හමුදා සේවයේ නියුතු හමුදා නිලධාරීන් සහ සෙබළුන් සේවයෙන් ඉවත් කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, එය කවර පදනමක් යටතේද;

(iii) හමුදා සේවය අතහැර ගොස් නැවත හමුදා සේවයට එක් වූ සෙබළුන්ට දඬුවම් දීමක් ලෙස ඔවුන්ව හමුදාවෙන් ඉවත් කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඔවුන් වෙනුවෙන් ලබා දෙන වන්දි හෝ වරප්‍රසාද කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) හමුදා සේවය අත්හැර ගිය සෙබළුන් නැවත හමුදා සේවයට බඳවා ගැනීමේදී ලබා දී ඇති දඬුවම්වලට අමතරව නැවත දඬුවම් දීමක් ලෙස හමුදා සේවයෙන් ඉවත් කිරීම බලවත් අසාධාරණයක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1186/’11

13.

ගරු රවී කරුණානායක මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රටේ නායයෑම් සිදුවීමේ දරුණු ප්‍රවනතාවක් පවතින්නේද;

(ii) අනාරක්ෂිත ප්‍රදේශ වශයෙන් හඳුනාගෙන ඇති, දරුණු ලෙස හානි සිදුවූ ප්‍රදේශ කවරේද;

(iii) මෙම බරපතල කරුණ සම්බන්ධයෙන් රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2010 දී සහ 2011 දී නායයෑම් හේතුවෙන් මියගිය අයගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මියගිය අය වෙනුවෙන් රජය විසින් ප්‍රදාන ලෙස ලබා දුන් මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1261/’11

14.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1617/’11

15.

ගරු මොහොමඩ් අස්ලම් මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දර්ගා නගරය, කාදියාවත්ත පාර, අංක 88 දරන ස්ථානයේ පදිංචි, එස්. එස්. පරීදා මිය ශ්‍රී ලංකා ගුරු සේවයේ 1 වැනි පංතියේ විශ්‍රාමික (විශ්‍රාම අංක 112550708) ගුරුවරියක බවත්;

(ii) 2004.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ගුරු සේවයේ 1 වැනි පංතියට උසස්වීම් ලැබූ නමුත්, එම උසස්වීම් අනුව විශ්‍රාම වැටුප හෝ එම තනතුරට පත්කරන ලද දිනයේ සිට හිමි හිඟ වැටුප් හෝ ඇයට මෙතෙක් ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, පරීදා මහත්මියට හිමි එම හිඟ වැටුප් ඇතුළු සංශෝධිත විශ්‍රාම වැටුප නොපමාව ලබාදීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන),— 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන),— 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන),— 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අධිකරණ අමාත්‍යතුමා,— අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*2.

පරිසර අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියෝග,— 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 32 (2) (ඎ) වැනි වගන්තිය යටතේ පාරිසරික සහ ස්වභාවික සම්පත් අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2009 නොවැම්බර් 10 දිනැති අංක 1627/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 1),— 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2010 ජුනි 29 දිනැති අංක 1660/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*5.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 2),— 1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනතින් සංශෝධිත, 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2010 මාර්තු 24 දිනැති අංක 1646/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*6.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 3),— 1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනතින් සංශෝධිත, 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2010 මාර්තු 24 දිනැති අංක 1646/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*7.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 4),— 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*8.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 5),— 1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනතින් සංශෝධිත, 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2009 සැප්තැම්බර් 01 දිනැති අංක 1617/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*9.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 6),— 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2011 පෙබරවාරි 23 දිනැති අංක 1694/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*10.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*11.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*12.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*16.

මුදල් ව්‍යාපාර පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*17.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.06.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*18.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.09.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*19.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2008,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.12.03 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික හා තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*20.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව 2008,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරි පනතේ 34 වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.06.30 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*21.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*22.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

24.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

25.

බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**